සිය හදවත බිඳුණු සිද්ධිය කෙතරම් දරුණුද යත් එය අමතක කළ නොහැකි බව යම් කෙනෙකුට හැඟෙන්නේ නම්, එම පුද්ගලයා දෙවියන් වහන්සේ වෙතට පැමිණිය යුතු අතර ඔහු කමාව දීම සඳහා දෙවියන් වහන්සේගේ ප්‍රේමය හා අනුග්‍රහය ඉල්ලිය යුතුය. ඔබට කමාවීම සඳහා අවශ්‍ය ඕනෑම දෙයක් දෙවියන් වහන්සේ දෙන සේක.

මෙම කමාවට ඔබද ඇතුළත්ය. මන්ද දෙවියන් වහන්සේ කමාව නොදෙන පාප සිදුකර ඇති බව ඔවුන්ට හැඟෙන බැවිනි. මෙය ගබ්සාවක් කරගත් ස්ත්‍රීන්ට විශේෂයෙන්ම සත්‍යයකි. ඇය මේ ගැන පසුතැවිලි වී සිය ගැලවුම්කරු ලෙසට යේසුස් ක්‍රිස්තුස් වහන්සේ වෙතට හැරෙන්නේනම්, එවිට දෙවියන් වහන්සේ කමාව දෙන සේක. සිය හදවත සුවකරගැනීම සඳහා ඇය උන් වහන්සේගේ කමාව පිළිගත යුතුය.

අනෙක් අතට, කුමන හෝ හේතුවක් නිසා දෙවියන් වහන්සේට විරුද්ධව අමනාපයක් ඇත. මෙම පුද්ගලයාගේ හදවත සුවවීම සඳහා මෙම අමනාපය දෙවියන් වහන්සේට පාපොච්චාරණය කළ යුතුය. සිය දහවත බිඳුණු දෙයට යම් කෙනෙක් කමාව දුන් විට, දැන් එම හදවත සුව කිරීමට හා ඔහු නිදහස් කිරීමට දෙවියන් වහන්සේ ට නිදහස ඇත.

හදවත බිඳුනු අය සුවකිරීම දෙවියන් වහන්සේට ඉතා වැදගත්ය. එය උන් වහන්සේ ට සුළු කරුණක් නොවේ. එය සදාතනික ගැළවීම පිළිබඳ යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ ශුභාරංචිය තරමටම පාහේ වැදගත්ය. යේසුස් ක්‍රිස්තුස් වහන්සේ තුළ ඇදහිල්ල තුළින් දෙවියන් වහන්සේගේ ප්‍රේමයෙන් හා සාමයෙන් පිරි සුවවූ හදවතක් ඇතිව ජීවත්වීමට අවශ්‍ය සියලු දෙය දෙවියන්ට සපයා ඇත.

Local Contact

## හදවත බිඳුනු අය සඳහා යාච්ඤාව

දෙවියන් වහන්සේ මම මාගේ පාප ඔබ වහන්සේට පාපොච්ඡාරණය කරන අතර ඊට පසුතැවිලි වෙමි. යේසුස් ක්‍රිස්තුන් වහන්සේ කුරුසිය මත උන් වහන්සේගේ ලේ හළා මාගේ පාප වෙනුවෙන් මියගිය බව මම විශ්වාස කරමි. දැන්ම යේසුස් ක්‍රිස්තුස් වහන්සේ මාගේ ස්වාමීන් වහන්සේ හා ගැළවුම්කාරයාණන් ලෙස පිළිගන්නා අතර දැන් මට ඔබ පියවූ දෙවියන් වහන්සේ ලෙස සදාතන ජීවිතය ඇත.

පියවූ දෙවියන් වහන්සේ ලෙස මාගේ බිඳුනු හදවත සුවකරන ලෙස මම ඔබ වහන්සේගෙන් ඉල්ලා සිටිමි. මාගේ හදවත බිඳ දැමූ සියල්ලන්ට මම කමාව දෙමි. කරුණාකර එය බියෙන්, කාන්සාවෙන්, බියගන්වන දෙයින්, වෛරයෙන්, අවපාතයෙන්, තිත්තකමින් හා ප්‍රතික්ෂේප කිරීමෙන් සුව කරන්න. එමෙන්ම මත්ද්‍රව්‍යවලින්, මධ්‍යසාරයෙන් හා සියලු ඇබ්බැහිවලින් නිදහස් කරන්න. මා පාපයෙන් නිදහස් කිරීමට හා මාගේ බිදුනු හදවත සුව කිරීමට යේසුස් ක්‍රිස්තුස් වහන්සේ එවීම ගැන ස්තූති වේවා.

ලූක් 4:18 *ස්වාමීන්වහන්සේගේ ආත්මය මා කෙරෙහිය, මක්නිසාද දිළිඳුන්ට ශුභාරංචිය දේශනාකරන්ට උන්වහන්සේ මා ආලේපකළසේක. වහලුන්ට මිදීම සහ අන්ධයන්ට පෙනීම ලැබෙන බව ප්‍රකාශකරන්ටද මඩනාලද්දවුන් නිදහස්කර හරින්ටද*


Chaplain John P. McTernan
Bishop Reinhard C. Sekar

**Asia Headquarters - Contact**

CCI DIOCESE
#1, Lifestar Apartments, Alwyn Nagar,
Sungam bypass road, Coimbatore - 641045
Tamilnadu. India

BrokenHeartedIndia@gmail.com
Luke14.8Heal@gmail.com

www.USAPROPHECY.com
www.CCIDIOCESE.org

Rev. S. G. Andrew - Srilanka Co-ordinator
brokenheartedsrilanka@gmail.com
www.ccidiocese.org


# යේසුස් ක්‍රිස්තුස්වහන්සේ

## හදවත බිඳුනු අය සුවකිරීම සඳහා පැමිණි සේක

ලූක් 4:18

...මඩනාලද්දවුන් නිදහස්කර හරින්ටද...ස්වාමීන්වහන්සේ මා එවූසේක

යෙසායා 61:1

...බිඳුණු සිත් ඇත්තන් සුවකරන්ටද... ස්වාමීන්වහන්සේ මා එවූසේක.



අද මත්ද්‍රව්‍ය භාවිතය, දොම්නස හා සියදිවි නසාගැනීම පිළිබඳ අර්බුදයක් ඇත. සාමාන්‍යයෙන් මත්ද්‍රව්‍ය ගැන කතා කරන විට මිනිසුන් සිතන්නේ කොකේන්, ක්‍රැක්, හෙරොයින් හෝ මර්ජුවානා පිළිබඳව වේ. මෙය ගැටළුවේ කොටසක් පමණි. විශාල පින්තූරයෙහි ප්‍රොසැක් හා අතාසැත් ප්‍රතිඅවපාත ඖෂධ වැනි නිර්දේශිත ඖෂධ හා වැලම් හා අනෙකුත් ඒ හා සම්බන්ධ ඖෂධ ද තිබේ. මීට ප්‍රබල ලෙස මත්පැන් ගැනීමද එක් කළහොත් ඇමරිකානුවෝ මිලියන ගණනක් විවිධාකාර ඖෂධ භාවිත කරන්නෝ වෙති.

මෙම පින්තූරයට දොම්නසට පත් අය, කාන්සාවෙන් හා ප්‍රබල ආතතියෙන් පෙළෙන එහෙත් මත්ද්‍රව්‍ය නොගන්නා අය ද එක් කළ යුතුය. මෙම දේවලින් බලපෑම් කෙරෙන සංඛ්‍යාව සෑම ඒවා වන අතර කෙනෙකුගේ සෞඛ්‍යයට දැඩිලෙස බලපායි. එමෙන්ම මරණය වුවද සිදුවිය හැකිය.

බොහෝ දුරට මත්ද්‍රව්‍ය ගන්නා අය, බිඳුනු හදවතක තුවාල සුව කර ගැනීමට උත්සාහ කරනවා විය හැකිය. මෙය එක්තරා ක්‍රමයක ස්වයං ප්‍රතිකාර ක්‍රමයකි. මන්ද ඔවුන් රිදීම් හා වෙන්දනාවන් යටපත් කිරීමට ක්‍රම සොයන බැවිනි. අභ්‍යන්තර වේදනාවට සුවය හා අභ්‍යන්තර සාමය අවශ්‍යය. දෙවියන් වහන්සේ විසින් යේසුස් ක්‍රිස්තුන් වහන්සේ එවීමට එක් ප්‍රධාන හේතුවක් මෙය වේ. උන්වහන්සේ පැමිණියේ බිඳුණු හදවත් ඇති අය සුව කිරීමට හා අපට අත්‍යාවශ්‍ය ඒ ගැඹුරු අභ්‍යන්තර සාමය ලබා දීමටය.

හදවතක් බිඳුණු විට සිදුවන දේ දැක්වීමට බයිබලය විස්තරාත්මක වචන භාවිතා කරයි. ඉන් දැක්වෙන පින්තූරය වන්නේ කෑලිවලට කැඩී බිඳී යන ප්‍රබල බිඳීමකි. ඔබ බොහෝ සේ බිඳීගිය ඇටකටුවක පින්තූරයක් දැක ඇත්නම් බිඳුනු හදවතක් ආතිමිකව පෙනෙන්නේ ඒ ආකාරයටය.

බිඳුණු හදවතක් තුළ කෝපය, බිය, කාන්සාව, බිහිසුණු ගතිය, වෛරය හා තිත්තකම ඇත. කලබල වී කරන ප්‍රහාර, දොම්නස හා මත්ද්‍රව්‍ය අවශ්‍ය වීම ආදියට තුඩු දෙන්නේ බිඳුණු හදවතකි. මෙම හැඟීම් උපදවන්නේ බිඳුනු හදවතක වන අතර මේවා ලක්ෂණ පමණි සැබෑ ගැටළුව බිඳුනු හදවත වේ.

## හදවත බිඳෙන්නේ කුමකින්ද?

දික්කසාදය (මෙය විශේෂයෙන්ම දරුවන්ට විනාශකාරිය) අපවාදය (ශාරීරික මෙන්ම මානසික) අත්හැර යෑම, ප්‍රතික්ෂේප කිරීම, වෛරය, සටන් කිරීම, ගබ්සාව, දුක්ඛදායක දේ හා මරණය මීට හේතු වේ.

මේ ලෝකය සැලසුම් කර ඇත්තේ අපගේ හදවත බිඳීමටය. හද බිඳුණු විට පිළියම් කිරීමට කිසි දෙයකට නොහැකිය. සියලු ඖෂධ සහතිව, මනෝ විද්‍යාත්මකව එය කළ නොහැකිය. සාමය සඳහා විවිධ පියහර සහිත ස්වයං උපකාර වැඩසටහන් ඇත. එහෙත් ඒවාට සුව කිරීමට නුපුළුවන. බිඳුනු හදවතක් සුවකළ හැකි කිසිවක් මෙලොව නැත. මන්ද එහි මුලය ආත්මික බැවිනි. කළ හැකි එකම දෙය බිඳුණු හදවතක ආවරණය අඩුකිරීම හෝ පාලනය කිරීම හෝ වේ. එහෙත් බිඳුනු හදවතක් සුව කළ හැක්කේ යේසුස් ක්‍රිස්තුස් වහන්සේට පමණි. උන්ව ගේ එක් නාමයක් වන්නේ ශ්‍රේෂ්ඨ වෛද්‍යවරයා වේ. උන් වහන්සේ බිඳුණු දහවත් සුවකිරීම සඳහා එවා ඇත.

කකුලක් ප්‍රබල ලෙස කැඩී බිඳී ගියවිට වෛද්‍යවරයා ඇට කැබලි ආපසු සකස්කර එය රෙදි පටියකින් වෙලනු ලබයි මේ සඳහා ඇතැම් විට කටුවලට ඉස්කුරුප්පු ඇණ දැමීම හා එය වඩා පැලැස්තරයක් දැමීම කළ යුතුවේ. බිඳුනු හදවතක් ශ්‍රේෂ්ඨ වෛද්‍යවරයා සුවකරන්නේද මේ ආකාරයෙන්මය. උන්වහන්සේ සියලුම බිඳුනු කොටස් ගෙන ඒවා එක් කොට බඳිනු ඇත. එවිට එය සුව වන්නේය.

බිඳුණු හදවතක් ගල් සිතක් ලෙස බයිබලය හඳුන්වයි. එහෙත් යේසුස් ක්‍රිස්තුස් සුවකළ හදවත කීකරු සිතක් ලෙස හැඳින්වේ. මෙය හදවත් බද්ධ කිරීමක් ලෙස සැලකිය හැකිය.

එසකියෙල් 36:26*මම අලුත් සිතක් නුඹලාට දී, අලුත් ආත්මයක් නුඹලා තුල තබා, නුඹලාගේ මාංසයෙන් ගල් සිත පහකොට, මාංසමයවූ සිතක් නුඹලාට දෙන්නෙමි.*

සුවකළ අලුත් හදවත දැන් දෙවියන්ට හා සුසර කර ඇත. ඊට දෙවියන් වහන්සේගේ ප්‍රේමය හා සාමය තබාගත හැකිය. අක්පීඩාගෙන අන් සියලුම හැඟීම් දැන් සදහටම අවසන් කළ හැකිය දෙවින් වහන්සේගේ සාමය සදහටම තම සිත් තළ තබාගෙන ජීවත්වීමට මිනිසුන් නිදහස් කළ හැකිය. ශුද්ධාත්මයාණන් වහන්සේගේ ප්‍රබල බලය තුළින් දෙවියන් වහන්සේට දැන් කාන්සාව හා දොම්නස යනාදිය මරණයට පත්කළ හැකිය.

2 තිමෙත්ති 1:7*මක්නිසාද දෙවියන්වහන්සේ අපට දුන්නේ බයාදුකමේ ආත්මයක් නොව බලයෙන් ප්‍රේමයෙන් හික්මවීමෙන් ආත්මයක්ය.*

සුවය ලද හදවතට උන්වහන්සේගේ ප්‍රේමය හා සාමය තබා ගැනීමට දෙවියන් වහන්සේට සැලසුම් කර ඇත. අප දෙවියන් වහන්සේ තුළ වර්ධනය වන විට, උන් වහන්සේගේ ප්‍රේමය හා සාමය අප තුළ අප තුළ වර්ධනය වේ එය කෙතරම්ද යත් අපගේ සාමය කිසිවකටත් ගත නොහැකි අතර අපගේ සිත් තුළින් උන් වහන්සේගේ ප්‍රේමය ඉවත් කිරීමටද කිසිවකුට නොහැකිය. දෙවියන් වහන්සේගේ ප්‍රේමයේ හා සාමයේ පූර්ණත්වය ඇතිව අපට උන් වහන්සේ සමඟ ජීවත් විය හැකිය.

බිඳුනු හදවතක් සුව කිරීමේ ප්‍රථම පියවර යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ ශුභාරංචිය විශ්වාස කිරීම වේ. බිඳුනු දහවත් ඇති අය දෙවියන් වහන්සේ සුවකිරීමට පෙර අප සොයා බැලිය යුතු පාපයේ ගැටළුව තිබේ.

පාපය භයානකය. එය නිසා මිනිසුන් දෙවියන් වහන්සේගෙන් වෙන් කෙරේ. දෙවියන්ට යේසුස් ක්‍රිස්තුන්ව එවන ලද්දේ මේ හිදැස පිරවීමටය.

පාපය සඳහා දඬුවම මරණය වේ. එහෙත් යේසුස් ක්‍රිස්තුන් වහන්සේ ඔබගේ පාපවලට වන්දි ගෙවීම සඳහා උන්වහන්සේගේ රුධිරය කුරුසිය මත හෙළු සේක. මින් අදහස් වන්නේ දෙවියන් වහන්සේ සමඟ තමාව හා සමගි කිරීම පාප සඳහා පසුතැවිලිවීම තුළින් ලැබෙන බවය. මෙය ඔබට දෙවියන් වහන්සේ සමඟ සදාතන ජීවනයද සහතික කෙරේ. පාපය පිළිබඳ ගැටළුව විසඳූ පසු ඔබගේ හදවත සුව කිරීමට දෙවියන් වහන්සේට නිදහස ඇත.

යොහන් 3:16*මක්නිසාද දෙවියන්වහන්සේ ස්වකීය ඒකජාතක පුත්‍රයාණන් දෙන තරම් ලෝකයාට ප්‍රේමකළසේක.*

ඊළඟපියවසේ අන්තර්ගතවන්නේ අන් අය කෙරෙහි ඔබගේ කමාව වේ. මෙම කමාවට මව්පියන් හෝ ඔබම වුවද නැතහොත් දෙවියන් වහන්සේ සමඟ සමගි කිරීම වූවද ඇතුළත් විය හැකිය. යේසුස් ක්‍රිස්තුන් වහන්සේ තුලින් දෙවියන් වහන්සේ අපගේ පාපවල කමාවන සේක. අපද අන් අයට කමාවිය අපද අන් අයට කමාවිය යුතුය.

මතෙව් 6:14*මක්නිසාද නුඹලා මනුෂ්‍යන්ට ඔහුන්ගේ වරද කමාකරන්නහු නම් නුඹලාගේ ස්වර්ගීයවූ පියාණන්වහන්සේ නුඹලාටත් කමාකරන සේක.*